ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
இலங்கைப் பொதுப் பயன்பாடுகள் ஆணைக்குழு
PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA

ඔබේ අංකය / உமது இல / Your No.    අපේ අංකය / எமது இல. / Our No.    දිනය / திகதி / Date **2024 මාර්තු 4**

# ප්‍රවෘත්ති නිවේදනය

- අද මධ්‍යම රාත්‍රියේ සිට විදුලි ගාස්තු සියයට 21.9 කින් අඩු කෙරේ
- ඒකක 30ට අඩු කාණ්ඩයේ පාරිභෝගිකයින්ගේ විදුලි ඒකක මිල සියයට 33කින් අඩු කෙරේ
- ඒකක 31ත් 60ත් අතර පාරිභෝගිකයින්ගේ බිල්පත සියයට 28කින් පහලට
- ඒකක 60ත් 90ත් අතර පාරිභෝගිකයින්ගේ බිල්පත සියයට 30කින් පහලට
- ඒකක 90ත් 180ත් අතර පාරිභෝගිකයින්ගේ බිල්පත සියයට 24කින් පහලට
- ඒකක 180ට වැඩි ගෘහස්ත කාණ්ඩය සඳහා සියයට 18කින් ගාස්තු අඩු කෙරේ
- ආගමික ස්ථානවලට සියයට 33ක අඩුකිරීමක්
- හෝටල් සහ කර්මාන්ත අංශවල බිල්පත සියයට 18කින් අඩුකෙරේ.
- පොදු කාර්ය කාණ්ඩයට සියයට 23ක අඩුවීමක්
- රාජ්‍ය අංශය සඳහා සියයට 22කින් විදුලි ගාස්තු අඩු කෙරේ.
- වීථි ලාම්පු සඳහා සියයට 20ක අඩුකිරීමක්

අද මධ්‍යම රාත්‍රියේ සිට බලපාන පරිදි විදුලිගාස්තු සංශෝධනය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අනුමැතිය ලබාදී තිබේ. සමස්ත ගාස්තු අඩුවීම සියයට 21.9කි. මෙම ගාස්තු සංශෝධනයේදී ලංකා විදුලිබල මණ්ඩලය ඉදිරිපත් කල යෝජනා හා වියදම් දත්ත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 30 වන වගන්තිය හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ප්‍රතිපාදනවලට අනුකූලව අධ්‍යනය හා සමාලෝචනය කර අවසන් තීරණයට එළඹෙන ලදී. ලංකා විදුලිබල මණ්ඩලය විසින් පසුගිය ජනවාරි මාසයේදී සියයට 3.34කින් හා පසුව පෙබරවාරි මස 22 වැනි දින ඉදිරිපත් කල ප්‍රතිශෝධිත යෝජනාවකින් සියයට 14කින් ගාස්තු අඩුකිරීමට යෝජනා කර තිබිණ. ලංකා විදුලිබල මණ්ඩලය ඉදිරිපත් කර තිබූ වියදම් දත්ත සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව කල සමාලෝචන හා මහජන උපදේශනයේදී ඉදිරිපත් වූ යෝජනාද සැළකිල්ලට ගෙන සියයට 21.9කින් සමස්ත ගාස්තු අඩුකිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

අද මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන මෙම ගාස්තු සංශෝධනයට අනුව සියළුම පාරිභෝගික කාණ්ඩවලට උපරිම වශයෙන් සහන සලසා ඇත. ගෘහස්ත අංශයේ ඒකක 30ට වඩා අඩු විදුලි ඒකක ප්‍රමාණයක් පරිභෝජනය කරන පාරිභෝගිකයින්ගේ විදුලි ඒකක මිල සියයට 33කින් අඩුකර ඇත. ඒකක 61ත් 90ත් අතර මාසික පරිභෝජනයක් ඇති විදුලි පාරිභෝගිකයින්ගේ බිල්පත් සියයට 30කින් අඩු වේ. ඒකක 90 වැඩි ඒකක 180ට අඩු කාණ්ඩය සඳහා සියයට 24කින් ද ඒකක 180ට වඩා වැඩි කාණ්ඩය සඳහා සියයට 18කින්ද විදුලි ගාස්තු අඩු කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අනුමැතිය ලබාදී ඇත. ආගමික ස්ථාන සඳහා සියයට 33කින් ගාස්තු අඩු කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව තීරණය කර ඇත.

පොදු කාර්ය පාරිභෝගික කාණ්ඩයට සියයට 23කින් ගාස්තු අඩු කෙරේ. රාජ්‍ය ආයතන කාණ්ඩය සඳහා ගාස්තු අඩුකෙරෙන්නේ සියයට 22 කිනි. හෝටල් සහ කර්මාන්ත යන අංශ සඳහා සියයට 18 කින් ගාස්තු අඩුකර ඇත. වීථි ලාම්පු සඳහා සියයට 20කින් ගාස්තු අඩු කෙරේ.

නව ගාස්තු ක්‍රමයට අනුව ඒකක 30ට අඩු පාරිභෝගිකයින්ගේ මාසික ගාස්තුව රුපියල් 180 සිට 150 දක්වා අඩු කෙරේ. ඔවුන් ගෙවන ඒකක මිල රුපියල් 12 සිට රුපියල් 8 දක්වා අඩුකර ඇත. ඒකක 31ත් 60ත් අතර පාරිභෝගික කාණ්ඩය ගෙවූ රුපියල් 360ක මාසික ගාස්තුව රුපියල් 300ක් දක්වා අඩුකර ඇති අතර එම කාණ්ඩය සඳහා ඒකක මිල රුපියල් 30 සිට 20 දක්වා අඩුකෙරේ. ගෘහස්ත කාණ්ඩ සඳහා මාසික ගාස්තුව හා ඒකක ගාස්තුව අඩුකර ඇති ආකාරය පහත දක්වා ඇත.

06 වන මහල, ලංකා බැංකු වෙළඳ කුළුණ, 26, ශාන්ත මයිකල් පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව. | 06 ஆவது மாடி, இலங்கை வங்கி வர்த்தகக் கோபுரம், 28, சென் மைக்கல் வீதி, கொழும்பு 03, இலங்கை. | Level 06, BOC Merchant Tower, 28, St. Michael's Road, Colombo 03, Sri Lanka.

Tel : +94 11 2392607/8    Fax : +94 11 2392641    E-mail : info@pucsl.gov.lk    Web : www.pucsl.gov.lk

සභාපති / தலைவர் / Chairman +94 11 2392604    අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General +94 11 2392606

| ගෘහස්ත අංශයේ පාරිභෝගික කාණ්ඩය | වත්මන් ඒකක මිල | අනුමත නව ඒකක මිල | වත්මන් මාසික ගාස්තුව | අනුමත නව මාසික ගාස්තුව |
|---|---|---|---|---|
| ඒකක 30ට අඩු | 12 | 8 | 180 | 150 |
| ඒකක 30-60 අතර | 30 | 20 | 360 | 300 |
| ඒකක 60 ට වැඩි කාණ්ඩ | | | | |
| පළමු ඒකක 60 | 38 | 25 | | |
| ඒකක 60ට වැඩි 90ට අඩු | 41 | 30 | 480 | 400 |
| ඒකක 90ට වැඩි ඒකක 120ට අඩු | 59 | 50 | 1,180 | 1,000 |
| ඒකක 120ට වැඩි ඒකක 180ට අඩු | 59 | 50 | 1,770 | 1,500 |
| ඒකක 180 වැඩි | 89 | 75 | 2,360 | 2,000 |

වහල මත සවිකල සූර්ය බලාගාර ඇතුළු පුනර්ජනනීය විදුලි බලාගාර හිමියන්ට කල යුතු ගෙවීම් සහ හිග පොලී මෙම මස 31ට පෙර ගෙවන ලෙස ද කොන්දේසී පනවා තිබේ. 2030 වන විට ඉලක්ක ගත පුනර්ජනනීය විදුලි ජනනය ලගාකර ගැනීම සඳහා සැලසුම් සකස් කර ජුනි මස 30ට පෙර ඉදිරිපත් කරන ලෙසද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලංවීමට කොන්දේසි පනවා ඇත.
ඉහත කොන්දේසී ඇතුලු කොන්දේසි 13ක් මෙම ගාස්තු ක්‍රමය ක්‍රියාවට නැංවීමට සමගාමීව ලංකා විදුලි බල මණ්ඩලය විසින් ක්‍රියාවට නැංවිය යුතු බවට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව තීරණය කර ඇත.
වැඩිදුර තොරතුරු සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ආයතනික සන්නිවේදන අංශයේ අධ්‍යක්ෂ ජයනාත් හේරත් මහතා 0772943193 අමතන්න

මහාචාර්ය මංජුල ප්‍රනාන්දු
සභාපති
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

## Tariff Table for a 30 Day Billing Cycle

| | Currently Effective Tariff | | Approved Tariff, Effective from 4th March 2024 | |
|---|---|---|---|---|
| | Energy Charge (LKR/kWh) | Fixed Charge (LKR/month) | Energy Charge (LKR/kWh) | Fixed Charge (LKR/month) |
| **Domestic** | | | | |
| Consumption 0-60 kWh per month | | | | |
| Block 1 : 0-30 kWh | 12.00 | 180.00 | 8.00 | 150.00 |
| Block 2 : 31-60 kWh | 30.00 | 360.00 | 20.00 | 300.00 |
| Consumption above 60kWh per month | | | | |
| Block 1 : 0-60 kWh | 38.00 | - | 25.00 | - |
| Block 2 : 61-90 kWh | 41.00 | 480.00 | 30.00 | 400.00 |
| Block 3 : 91-120 kWh | 59.00 | 1,180.00 | 50.00 | 1,000.00 |
| Block 4 : 121-180 kWh | 59.00 | 1,770.00 | 50.00 | 1,500.00 |
| Block 5 : Above 180 kWh | 89.00 | 2,360.00 | 75.00 | 2,000.00 |
| **Domestic Time Of Use** | | | | |
| Peak [18:30 to 22:30] | 106.00 | 2,360.00 | 90.00 | 2,000.00 |
| Day [05:30 to 18:30] | 83.00 | | 70.00 | |
| Off Peak [22:30 to 05:30] | 35.00 | | 30.00 | |
| **Religious** | | | | |
| Block 1 : 0-30 kWh | 12.00 | 180.00 | 8.00 | 150.00 |
| Block 2 : 31-90 kWh | 24.00 | 300.00 | 9.00 | 250.00 |
| Block 3 : 91-120 kWh | 41.00 | 710.00 | 18.00 | 600.00 |
| Block 4 : 121-180 kWh | 53.00 | 1,770.00 | 32.00 | 1,500.00 |
| Block 5 : Above 180 kWh | 59.00 | 2,360.00 | 43.00 | 2,000.00 |

| **Other Consumers** | | **Industrial/Hotel** | | **General Purpose/Government** | | **Industrial** | | **Hotel** | | **General Purpose** | | **Government** | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Volume Differentiated Monthly Consumption (kWh/month) | | <300 | >300 | <180 | >180 | <300 | >300 | <300 | >300 | <180 | >180 | <180 | >180 |
| Supply at 400/230V & Contract Demand<42kVA (1) | Energy Charge (LKR/kWh) | 20.00 | 28.00 | 43.00 | 56.00 | 13.50 | 21.50 | 13.50 | 21.50 | 33.00 | 43.00 | 33.00 | 43.00 |
| | Fixed Charge (LKR/month) | 340.00 | 1,120.00 | 750.00 | 1,860.00 | 300.00 | 1,000.00 | 300.00 | 1,000.00 | 600.00 | 1,500.00 | 600.00 | 1,500.00 |
| Optional Time Of Use | Peak [18:30 to 22:30] (LKR/kWh) | 41.00 | | | | 37.00 | | | | | | | |
| | Day [05:30 to 18:30] (LKR/kWh) | 38.00 | | | | 33.00 | | | | | | | |
| | Off Peak [22:30 to 05:30] (LKR/kWh) | 32.00 | | | | 28.00 | | | | | | | |
| | Fixed Charge (LKR/month) | 1,120.00 | | | | 1,000.00 | | | | | | | |
| Supply at 400/230V & Contract Demand >42kVA (2) | Peak [18:30 to 22:30] (LKR/kWh) | 41.00 | | 68.00 | | 37.00 | | 37.00 | | 55.00 | | 55.00 | |
| | Day [05:30 to 18:30] (LKR/kWh) | 38.00 | | 58.00 | | 30.50 | | 30.50 | | 45.00 | | 45.00 | |
| | Off Peak [22:30 to 05:30] (LKR/kWh) | 32.00 | | 48.00 | | 25.50 | | 25.50 | | 37.00 | | 37.00 | |
| | Demand Charge (LKR/kVA) | 1,800.00 | | 2,000.00 | | 1,500.00 | | 1,500.00 | | 1,500.00 | | 1,500.00 | |
| | Fixed Charge (LKR/month) | 5,600.00 | | 6,200.00 | | 5,000.00 | | 5,000.00 | | 5,000.00 | | 5,000.00 | |
| Supply at 11kV & above (3) | Peak [18:30 to 22:30] (LKR/kWh) | 40.00 | | 67.00 | | 36.00 | | 36.00 | | 54.00 | | 54.00 | |
| | Day [05:30 to 18:30] (LKR/kWh) | 37.00 | | 57.00 | | 30.00 | | 30.00 | | 44.00 | | 44.00 | |
| | Off Peak [22:30 to 05:30] (LKR/kWh) | 31.00 | | 47.00 | | 24.50 | | 24.50 | | 36.00 | | 36.00 | |
| | Demand Charge (LKR/kVA) | 1,680.00 | | 1,860.00 | | 1,400.00 | | 1,400.00 | | 1,400.00 | | 1,400.00 | |
| | Fixed Charge (LKR/month) | 5,600.00 | | 6,200.00 | | 5,000.00 | | 5,000.00 | | 5,000.00 | | 5,000.00 | |

| | Currently Effective Tariff | | Approved Tariff, Effective from 4th March 2024 | |
|---|---|---|---|---|
| **Street Lighting** | | | | |
| Energy Charge (LKR/kWh) | 56.00 | | 45.00 | |
| **EV Charging Stations** | **DC Fast Charging** | **AC Level 2 Charging** | **DC Fast Charging** | **AC Level 2 Charging** |
| Peak (LKR/kWh) | 139.00 | 112.00 | 139.00 | 112.00 |
| Day (LKR/kWh) | 109.00 | 87.00 | 109.00 | 87.00 |
| Off Peak (LKR/kWh) | 66.00 | 50.00 | 66.00 | 50.00 |

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
இலங்கை பொதுப்பயன்பாடுகள் ஆணைக்குழு
**Public Utilities Commission of Sri Lanka**

## Tariff Revision Percentages

| Category | | % Change in Revenue |
|---|---|---|
| **Domestic Overall** | | -24.1% |
| **Domestic** | **0-30** | -23.7% |
| | **31-60** | -28.2% |
| | **61-90** | -30.4% |
| | **91-180** | -24.0% |
| | **180<** | -18.3% |
| | **D-TOU** | -15.2% |
| **General Purpose** | | -22.7% |
| **Government** | | -22.4% |
| **Hotel Purpose** | | -17.5% |
| **Industrial Purpose** | | -18.1% |
| **Religious Purpose** | | -32.8% |
| **Street Lamp** | | -19.6% |
| **Overall** | | **-21.9%** |